සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය ............................

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** කාලය පැය තුනයි

**ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) I. සන්නිවේදනය පිළිබඳ එඩ්වඩ් ෂැපීර්ගේ නිර්වචනය ලියන්න.

II. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය අසම්පූර්ණ අකෘතියක් බව, පසුකාලීන සන්නිවේදන විද්වතුන්ගේ අදහසයි. ඔබ මෙම අදහසට එකඟවේද? නොවේද? හේතු පැහැදිලි කරන්න.

III. ස්ව - සංකල්පය පෝෂණය කළ හැක්කේ කෙසේදැයි කරුණු 03 ක් ඇසුරෙන් විස්තර කරන්න.

IV. සංජානනය යන්න පැහැදිලි කොට ග්‍රාහකයාගේ සංජානනයට බාධා කළ හැකි හේතු 3 ක් විස්තර කරන්න.

(2) I. සන්නිවේදන ඉතිහාසය තුළ අධිපතිවාදී සන්නිවේදන සංකල්පය ක්‍රියාත්මක වීමට විරුද්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග ඇතත්, වර්තමානයේ ද අධිපතිවාදය ක්‍රියාත්මක වන අවස්ථා බහුලය. වර්ථමානයේ අධිපතිවාදී සංකල්පය ක්‍රියාත්මක වන ආකාර 4 ක් දක්වන්න.

II. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය අන්‍යාන්ට ප්‍රකට වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

III. ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යන්ගෙන් සාකච්ඡා නොවන, සමාජ යථාර්ථයන් අභියෝගාත්මකව දක්වන ජනමාධ්‍යවේදී ශෛලිය නම් කර එහි ලක්ෂණ 3 ක් පැහැදිලි කරන්න.

IV. භාෂාව නිපදවාගත් පසු, භාෂාවේ සංවර්ධනය සඳහා දායක වූ අවස්ථා 4 ක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න.

(3) I. දැන්වීම් ප්‍රචාරක ආයතනයක් සිදු කරනු ලබන ප්‍රචාරක කාර්යයන් 4 ක් සඳහන් කරන්න.

II. සන්නිවේදන හා ග්‍රාහක ස්ථාන හුවමාරු වෙමින් සන්නිවේදන කේන්ද්‍රීය මෙන්ම ග්‍රාහක කේන්ද්‍රීය සංකල්පය ද වැදගත් වන බව පෙන්වන සන්නිවේදන ආකෘතිය නම් කර ආකෘතිය කෙටියෙන් විස්තර කරන්න.

III. සම්පාදනය කරන ලද මහජන සම්බන්ධතා සැලැස්මක 'පෙර ඇගයීම' යන්න පැහැදිලි කොට පෙර ඇගයීමක් සිදු කිරීමේ අවශ්‍යතාව කරුණු 2 කින් විස්තර කරන්න.

IV. මාධ්‍ය පවතින්නේ ව්‍යාපාරික අධිපත්‍ය මතය. මෙම අදහසේ සත්‍යතාව දැක්වීමට කරුණු 4 ක් ආශ්‍රයෙන් කෙටි රචනයක් ලියන්න.

(4) I. මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් දක්වා ඇති. සංවර්ධනය සඳහා ජනමාධ්‍ය භාවිතයට ගැනීමෙන් ඉටුකරගත හැකි අපේක්ෂා 4 ක් ලියන්න.

II. සමථකරණයට යොමුවීමෙන් පාර්ශවකරුවන්ට අත්වන වාසි 4 ක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

III. පසුගිය සිංහල අලුත් අවුරුදු කාලය තුළ ජංගම දුරකථන සිම්පතක් වඩාත් ජනප්‍රිය කිරීමට, ගී ගයන කොහා ත් ඔන්චිලි පදින සහ රබන් ගසන, චීත්ත, අත් බෝරිච්චි හැට්ට සහ සරොම් කමිස ඇඳි, පෙනුමෙන් නාගරික තරුණ තරුණියන් ඇතුලත් ආකර්ෂණීය වෙළඳ දැන්වීමක් ප්‍රචාරය කරන ලදී, මේ ආශ්‍රයෙන් නූතන දැන්වීම් කරණයේ දී ජනශ්‍රැතිය යොදා ගැනීමේ ක්‍රමවේදය තුළ මෙම වෙළඳ දැන්වීම පිළිබඳ කරුණු 3 කින් විස්තර කරන්න.

IV. සංවර්ධන සන්නිවේදනයේ මූලික ලක්ෂණයක් වන 'ප්‍රජාව බලගැන්වීම' සඳහා යොදාගත හැකි ක්‍රියාවලීන් 4 ක් විස්තර කරන්න.

(5) I. 'භාෂා උපාර්ජනය' සහ 'සන්නිවේදනය' අතර ඇති සම්බන්ධතාවය කුමක්දැයි පැහැදිලි කරන්න.

II. මාධ්‍ය විචාරය තුළ මාධ්‍ය නිර්මාණ සහ සම්ප්‍රදායික නිර්මාණ අතර වෙනස කරුණු දෙකක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

III. සන්නිවේදනයේ සමාජීය බලපෑම කරුණු 3 ක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

IV. ගෘහස්ථ සාමය සහ සහජීවනය කළමණාකරණය කර ගත හැකි ආකාරය කරුණු 4 ක් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(6) I. 'ජනප්‍රිය සංස්කෘතිය' යන්න හඳුන්වා, එහි අන්තර්ගතයේ සහභාගිකයන් දක්වන්න.

II. මාධ්‍ය සාක්ෂරතාවය සහ මාධ්‍ය අධ්‍යාපනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

III. මාධ්‍ය සංස්කෘතියට නිදහස්ව හැසිරීමට ඉඩ ලැබෙන්නේ කුමන සමාජ පසුබිම් වලදීදැයි කරුණු තුනක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

IV. 'නිර්මාණශීලී රූපණයේ' අංග නම්කර, එම අංග කෙටියෙන් පැහැදිලි කරන්න.

(7) I. සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට භාවිතා කළ හැකි විවිධ සන්නිවේදන උපකරණ වර්ග 4 ක් නම් කරන්න.

II. චීන සංවර්ධන සන්නිවේදන ආකෘතියෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු 4 ක් සඳහන් කරන්න.

III. සාමූහික සබඳතාවයක් ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීමට භාවිතයට ගත හැකි සමූහ සන්නිවේදන නිපුණතා නම්කර එයින් දෙකක් විස්තර කරන්න.

IV. මානසික පීඩා ඇතිවීම ස්වභාවික නිසා ඊට මුහුණ දීමේ ශක්තිය ඇතිකර ගැනීමට භාවිතා කළ හැකි උපදෙස් හතරක් විස්තර කරන්න.